**ශීර්ෂය 312 - බස්නාහිර පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

## 1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

### 1.1 දැක්ම

සහජීවනය සහ තිරසාර සංවර්ධනය තුළින් බස්නාහිර පළාත පෙරට.

### 1.2 මෙහෙවර

මූල්‍ය, භෞතික හා මානව සම්පත් ප්‍රශස්ථ ලෙස මෙහෙයවමින් සියළු ප්‍රජාවට සෙත සැළසෙන සාමය හා සහජීවනයෙන් පිරි තිරසාර සංවර්ධනයක් උදාකිරීම.

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

## 2. විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

බස්නාහිර පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 19,194.34 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 16,664.98 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 2,529.36 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13.18 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2017 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 15,090.98 | 15,090.98 | - | - |
| මූලධන | 4,103.36 | 1,574.00 | 2,529.36 | 61.64 |
| **එකතුව** | **19,194.34** | **16,664.98** | **2,529.36** | **13.18** |

## 3. විගණන නිරීක්ෂණය

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනය කර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.